

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

ஸ்ரீலங்கா கோஸ்ட் காவலர் துறை

DEPARTMENT OF SRI LANKA COAST GUARD

2025

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்திர செயல்திறன் அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය 325

අන්තර්ගතය		පිටු අංක
අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය		
පරිච්ඡේදය 1 -	ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1 - 3
පරිච්ඡේදය 2 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	4 - 9
පරිච්ඡේදය 3 -	වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය	10 – 13
පරිච්ඡේදය 4 -	කාර්ය සාධන දර්ශක	14 - 16
පරිච්ඡේදය 5 -	තිරසාර සංවර්ධන අරමුණ (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	17
පරිච්ඡේදය 6 -	මානව සම්පත් පැතිකඩ	18 - 20
පරිච්ඡේදය 7 -	අනුකූලතා වාර්තාව	21 - 26

අධ්‍යක්ෂ ජෙනරාල්තුමාගේ පණිවිඩය



“සුසැදි සයුරක්” යන තේමාව පෙරදැරි කරගනිමින්, ශ්‍රී ලංකාද්වීපයට අයත් සමුද්‍රීය කලාපයේ, දේශීය ජල තීරයේ මෙන්ම වෙරළබඩ කලාපයේ ආරක්ෂාව සහ ස්ථෛරීභාවය තහවුරු කිරීම උදෙසා කැපවීම ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම වගකීම සහ කාර්යභාරය වේ. මව්බිම වටා වූ සාගර කලාපයේ ආරක්ෂාව, සුරක්ෂිතභාවය සහ පවිත්‍රතාව නිරන්තරයෙන් අධීක්ෂණය කරමින්, සමුද්‍රීය නීතිය බලාත්මක කිරීමේ මූලික අරමුණ පෙරදැරිව අප ඉහළ කාර්ය සාධනයකින් යුතුව ක්‍රියාත්මක වේ.

නාවික සහ සමුද්‍රීය ක්ෂේත්‍රයේ නැගී එන අභියෝගයන් මැනවින් හඳුනාගනිමින්, මහා සයුරේ සිදුවන නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම් මර්දනය, අනවසර ධීවර කටයුතු වැළැක්වීම සහ සමුද්‍රීය නීතිය බලාත්මක කිරීම වෙනුවෙන් අප දෙපාර්තමේන්තුව නිරන්තර අවධානයකින් හා සන්නද්ධතාවකින් පසුවේ. එමෙන්ම, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සමුද්‍රීය තෙල් විසිරීම් සහ පරිසර දූෂණ තත්ත්වයන්හිදී "පළමු ප්‍රතිචාරකයා" (First Responder) ලෙස සක්‍රීයව කටයුතු කරන අතර, දිවයින පුරා ස්ථාපිත ජීවිතාරක්ෂක මුරකුටි මඟින් දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ආරක්ෂාව සැලසීමත්, කැස්බෑ සංරක්ෂණය ඇතුලු සමුද්‍රීය ජෛව විවිධත්වය සුරැකීමේ ව්‍යාපෘති මඟින් පරිසර පද්ධතිය රැකගැනීමටත් සුවිශේෂී දායකත්වයක් සපයයි. ස්වභාවික ව්‍යසන අවස්ථාවන්හිදී ආපදාවට ලක්වන ජනතාව මුදවා ගැනීමේ සහ සහන සැලසීමේ ජාතික මෙහෙයුම් වලදී ද දෙපාර්තමේන්තුව පෙරමුණ ගෙන ක්‍රියා කරයි.

පසුගිය කාල පරිච්ඡේදය පුරා දේශීය හා විදේශීය වශයෙන් එල්ල වූ විවිධ ආර්ථික හා සමාජයීය අභියෝග හමුවේ වුවද, රටේ ප්‍රගතිය සහ ජාතික ආරක්ෂාව වෙනුවෙන් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව තම වගකීම් නොපිරිහෙලා ඉටුකර ඇත. විශේෂයෙන්ම, 2025 වසරේදී අප දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය උපරිම මට්ටමකට ළඟා කර ගැනීමට හැකි වීම ඊට මනා උදාහරණයක් වන අතර, වත්මන් රජයේ සංකල්පයන්ට අනුගත වෙමින් මව්බිමේ ස්ථාවරත්වය සහ තිරසාර සංවර්ධනය කරා යන නව මාවත ශක්තිමත් කිරීමට අප දෙපාර්තමේන්තුව නිරතුරුවම කැපවී සිටී.

රට මුහුණ දෙන තීරණාත්මක අවස්ථාවන්හිදී නොසැලී සිටිමින්, දෙපාර්තමේන්තුවේ උන්නතිය උදෙසාත්, මව්බිමේ ආරක්ෂාව උදෙසාත් උපරිම කැපවීමෙන් හා විනයගරුකව තම සේවය ලබාදෙන සියලුම වෙරළ ආරක්ෂක නිලධාරීන්ට සහ සෙසු නිලයන් වෙත මාගේ හෘදයාංගම ස්තුතිය පුදකර සිටිමි. මින් ඉදිරියට රටත් ජාතියත් වෙනුවෙන් තම වගකීම් ඉටුකිරීමට අවශ්‍ය ශක්තිය, ධෛර්යය සහ වාසනාව සමස්ත වෙරළ ආරක්ෂක කාර්ය මණ්ඩලයටම ලැබෙවායි ප්‍රාර්ථනා කරන අතර, 2025 වසරට අයත් කාර්ය සාධන වාර්තාව සාර්ථකව සකස් කිරීමට දායකවූ සැමට මාගේ කෘතඥතාව පිරිනමමි.

ආර් ජෙ සෆ්, ආර්එස්පී, යූඑස්පී, එන්ඩබ්ඩිසී, පීඑස්සී
රියර් අද්මිරාල්
අධ්‍යක්ෂ ජෙනරාල්

පරිච්ඡේදය 1 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 පොදු සමාලෝචනය

2009 දෙසැම්බර් මස 09 වන දින ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුවේ සම්මත 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක පනත මඟින් මුහුදේදී ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම, ශ්‍රී ලංකාවට අයත් සමුද්‍රීය කලාපයේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම, සමුද්‍රීය දූෂණයෙන් සාගර සම්පත් සහ සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීම, සුරක්ෂිත සහ සාමකාමී සාගර කලාපයක් ඇති කිරීම යන දැක්ම සහ මෙහෙවර සහතික කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති රාජ්‍ය ආයතනයකි. ශ්‍රී ලංකාවට අයත් සාගර කලාපය තුළ නීතිවිරෝධී ක්‍රියාකාරකම්වල නිරතව සිටින නෞකා, යාත්‍රා හා පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සහ ශ්‍රී ලංකාවට අයත් සමුද්‍රීය කලාපයේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත සඳහන් පනත මඟින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට බලය ලබාදී ඇත. 2010 මාර්තු මස 03 වන දින නිල වශයෙන් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පසුගිය වසර කිහිපය තුළ සීඝ්‍ර ප්‍රගතියක් ලබා ඇත.

1.2 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර

අ. **දැක්ම**

"සාමකාමී සමුද්‍රීය පරිසරයක් තුළින් ජාතික සුභ සිද්ධිය ආරක්ෂා කිරීම."

ආ. **මෙහෙවර**

සමුද්‍රීය පරිසරයේ ආරක්ෂාව, සුරක්ෂිතභාවය, පවිත්‍රතාවය සහතික කිරීම සහ බලාත්මක සමුද්‍ර නීතිය ක්‍රියාත්මක කිරීම, ජෛව විවිධත්ව කළමනාකරණය, ස්වභාවික හා මිනිසා විසින් නිර්මාණය කරනු ලබන ව්‍යසනයන් කළමනාකරණය සහ ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම වේ.

තවද, සමුද්‍ර පරිසරය සුරක්ෂිත කිරීම තුළින් පරිසර සමතුලිතතාවය පවත්වා ගැනීම, සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ 1.3 යටතේ පහත ඉදිරිපත් කර ඇති කාර්යය හා කර්තව්‍යයන් ඊට ඇතුළත් වේ.

1.3 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යය සහ කාර්යභාරය

අ. ශ්‍රී ලංකාවට අයත් සමුද්‍රීය කලාපයෙන් පිටතදී සිදුවන නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම් කටයුතු වැළැක්වීම.

ආ. ශ්‍රී ලංකාවට අයත් සමුද්‍රීය කලාපයේ සහ දේශීය ජල තීරය තුළ සිදුකරන ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මර්ධනය කිරීම සඳහා නීතිය බලාත්මක කිරීමේ ආයතනයන් සහ සන්නද්ධ හමුදාවන් වෙත සහයෝගය ලබා දීම.

ඇ. ස්වභාවික ව්‍යසනයන්හිදී විපතට පත්වූ පුද්ගලයන් සෙවීමේ හා ගලවාගැනීමේ රාජකාරී කටයුතු සඳහා දායකත්වය ලබාදීම.

ඈ. ශ්‍රී ලංකා වෙරළ තීරය තුළ සිදුවන නීති විරෝධී/ අවිධිමත් සහ වාර්තාගත නොවන මසුන් ඇල්ලීමේ කටයුතු (IUU Fishing) වැළැක්වීම, මුහුදේදී ධීවරයන්ට අවශ්‍ය සහයෝගය ලබා දීම සහ ධීවරයින් ආරක්ෂා කිරීම.

ඉ. සමුද්‍රීය පරිසරය සංරක්ෂණය සහ ආරක්ෂා කිරීම සඳහා දායක වීම.

ඊ. සමුද්‍රීය දූෂණය හා ව්‍යසනයන් වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම මෙන්ම එම කටයුතු නියාමනය කිරීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන වෙත සහයෝගය ලබා දීම.

උ. නීති විරෝධී භාණ්ඩ ජාවාරම් කිරීමට එරෙහිව සහ ආගමනයට එරෙහිව කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව සහ ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්යය බලකාය ඇතුලුව අනෙකුත් රාජ්‍ය ආයතනයන් වෙත සහයෝගය ලබා දීම.

ඌ. මුහුදේදී ජීවිත හා දේපළවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම.


එ. සමුද්‍රීය ජීවීන් විශේෂ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා දායක වීම.

ඒ. ස්වභාවික ව්‍යවසනයන්හිදී ගුවන්විදුලි හෝ වෙනත් ක්‍රමවේදයන් මඟින් නිකුත් කරනු ලබන අනතුරු ඇඟවීමේ තත්ත්වයන් පිළිබඳව තොරතුරු ව්‍යාප්ත කිරීමට දායක වීම.

ඔ. රජය විසින් නිකුත් කරනු ලබන නියෝගයන්ට අනුව අනෙකුත් රාජකාරීන් සිදු කිරීම.

ඕ. මුහුදේදී සිදුවන ස්වභාවික ව්‍යවසනයන් සහ මුහුදු අනතුරුවලින් විපතට පත්වන ජීවිත හා දේපළ ගලවා ගැනීමේ කටයුතු සඳහා සහයෝගය ලබාදීම.


1.4 සංවිධාන සටහන



1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තුමේන්තු/ දෙපර්තුමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශිය ලේකම් කාර්යාල

භාර දී ඇති කාර්යයන් හා කාර්යයන්වල අනුකූලතාවය සහතික කිරීම මඟින් ශ්‍රී ලංකාවේ සමස්ථ වෙරළ තීරය ආවරණය වන පරිදි සිය කඳවුරු, ස්ථාන, උප පොළවල්, ධීවර අධීක්ෂණ ස්ථාන (එෆ්එම්පී) සහ ජීවිතාරක්ෂක ස්ථාන (එල්එස්පී) සහ නාවික ඒකක යොදවා ඇත. තවද, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය සහ පරිපාලනමය පහසුව වෙනුවෙන් පහත දැක්වෙන පරිදි රටේ සමස්ත වෙරළ තීරය ආවරණය වන පරිදි වෙරළාරක්ෂක කලාප හතරක් ස්ථාපිත කර ඇත.

අ. වෙරළාරක්ෂක උතුරු කලාපය
ආ. වෙරළාරක්ෂක නැගෙනහිර කලාපය
ඇ. වෙරළාරක්ෂක දකුණු කලාපය
ඈ. වෙරළාරක්ෂක බටහිර කලාපය



1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතනය/ අරමුදල්

නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (ඇති නම්)

නැත

පරිච්ඡේදය 2 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව 2025 වර්ෂය තුළදී එහි සඳහන් ප්‍රමුඛ ක්‍රමෝපායන් වලට අදාළව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් පහත සඳහන් මෙහෙයුම්/ කාර්යයන් සිදුකර ඇත.

අ. මුහුදු නීති ක්‍රියාත්මක කිරීම හා නීති විරෝධී ක්‍රියාවන් වැළැක්වීම සඳහා සිදුකරනු ලැබූ වෙරළ ආරක්ෂක මෙහෙයුම්.

දිවයින වටා ඇති මුහුදු තීරයේ සිදුවන නීති විරෝධී ක්‍රියාවන් වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි ඇති නෞකා, යාත්‍රා සහ ඩ්‍රෝන යාන අවස්ථානුකූලව යොදවනු ලබන අතර, නැගෙනහිර, උතුර, දකුණු සහ බටහිර කලාපයන්ට අනුයුක්තව පහත පරිදි මෙහෙයුම් හා නිරීක්ෂණ කටයුතු සිදු කරයි. තවද, මිරිස්ස, ත්‍රිකුණාමලය හා කල්පිටිය ප්‍රදේශයන්හි තල්මසුන් නැරඹීමේ කටයුතු නිරීක්ෂණයට ද වෙරළ ආරක්ෂක නෞකා හා යාත්‍රා යොදවනු ලබයි.

1.	නිරීක්ෂණ මුර සංචාර නෞකා (OPV)	02
2.	වේග මුර නෞකා (FPV)	02
3.	වේග මුර යාත්‍රා (FPB)	10
4.	වෙරළබඩ මුර සංචාර යාත්‍රා (IPC)	10
5.	ස්ටැබී ක්‍රාෆ්ට්	04
6.	ඕනෑම භූමියක ගමන් කල හැකි වාහන (ATV)	03
7.	නියමුවන් රහිත ගුවන් යානා (ඩ්‍රෝන යානා) පියාසර කරවීම	12

<u>නැගෙනහිර කලාපයට අනුයුක්ත යාත්‍රා</u>

1.	ශ්‍රීලංවෙආනෞ ජයසාගර	
2.	CG 401	ත්‍රිකුණාමලය නාවික වරාය
3.	CG 403	ත්‍රිකුණාමලය නාවික වරාය
4.	CG 404	ත්‍රිකුණාමලය නාවික වරාය
5.	CG 408	ත්‍රිකුණාමලය නාවික වරාය
6.	CG 209	කොඩ්බේ ධීවර වරාය
7.	CG 210	කොඩ්බේ ධීවර වරාය
8.	CG 80	කොඩ්බේ ධීවර වරාය

<u>උතුර කලාපයට අනුයුක්ත යාත්‍රා</u>

1.	CG 402	කන්කසන්තුරය නාවික වරාය
2.	CG 406	කන්කසන්තුරය නාවික වරාය
3.	CG 407	කන්කසන්තුරය නාවික වරාය
4.	CG 409	කන්කසන්තුරය නාවික වරාය
5.	CG 410	කන්කසන්තුරය නාවික වරාය
6.	CG 405	කන්කසන්තුරය නාවික වරාය
7.	CG 203	කන්කසන්තුරය නාවික වරාය
8.	CG 204	කන්කසන්තුරය නාවික වරාය

<u>දකුණු කලාපයට අනුයුක්ත යාත්‍රා</u>

1.	CG 201	මිරිස්ස ධීවර වරාය
2.	CG 207	මිරිස්ස ධීවර වරාය
3.	CG 104(Stabi Craft)	මිරිස්ස ධීවර වරාය
4	CG 106 (RHIB)	කිරින්ද ධීවර වරාය
5.	CG 107(Stabi Craft)	මිරිස්ස ධීවර වරාය

<u>බටහිර කලාපයට අනුයුක්ත යාත්‍රා</u>

1.	ශ්‍රීලංවෙආනෞ සුරක්ෂා	කොළඹ වරාය
2.	ශ්‍රීලංවෙආනෞ සමුද්‍රාරක්ෂා	කොළඹ වරාය
3.	ශ්‍රීලංවෙආනෞ සමාරක්ෂා	කොළඹ වරාය
4.	CG 202	කල්පිටිය නාවික වරාය
5.	CG 205	වෙල්ලමංකර ධීවර වරාය
6.	CG 206	බේරුවල ධීවර වරාය
7.	CG 208	දික්ඔවිට ධීවර වරාය
8.	CG 101(Harbor Craft)	හලාවත ධීවර වරාය

9.	CG 102(Harbor Craft)	පානදුර ධීවර වරාය
10.	CG 105(Stabi Craft)	හලාවත ධීවර වරාය
11.	CG 103(Stabi Craft)	දික්ඕවිට ධීවර වරාය

ආ. **<u>නීති විරෝධී, අකුමවත් වාර්තා නොවන මසුන් මැරීම් හා මත් ද්‍රව්‍ය ජාවාරම්.</u>**

1. නීති විරෝධී මසුන් ඇල්ලීම සහ මසුන් ඇල්ලීම සම්බන්ධ නීති විරෝධී ක්‍රියාකාරකම්, මත් ද්‍රව්‍ය ජාවාරම්, මිනිස් ජාවාරම් හා තහනම් භාණ්ඩ මුහුදු මගින් ප්‍රවාහනය වැනි නීතිවිරෝධී ක්‍රියාවන් වැළැක්වීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මට සහාය වීම සඳහා දිවයින පුරා පිහිටි ධීවර වරායන් ආවරණය වන පරිදි ධීවර නිරීක්ෂණ ස්ථාන 28 ක් ස්ථාපිත කර ඇත. තවද සියලුම ධීවර යාත්‍රා ධීවර ආඥාපන්න, බෝට්ටු කාර්ය මණ්ඩලය සහ යාත්‍රාවල ඇති උපකරණවල නීත්‍යානුකූලභාවය සහතික කිරීම සඳහා මුහුදට යාමට පෙර පරීක්ෂාවට ලක්කරනු ලබන අතර, යාත්‍රා පැමිණෙන විට ද මසුන් ඇල්ලීමේ නීත්‍යානුකූලභාවය සහතික කිරීම සඳහා එම පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියම සිදු කරනු ලබයි.

2. තවද, ධීවර පිරික්සුම් මධ්‍යස්ථාන රාජකාරියේ නියුතු ශ්‍රී ලංවෙආදෙ නිලධාරීන් මත් ද්‍රව්‍ය සහ නීති විරෝධී ලෙස ධීවර කටයුතු සිදුකරන ලද යාත්‍රා හා පුද්ගලයින් විවිධ අවස්ථාවන් වලදී අත්අඩංගුවට ගැනීමට සමත් විය. එසේ අත්අඩංගුවට පත් භාණ්ඩ හා පුද්ගලයින්ට එරෙහිව අදාළ ධීවර පරීක්ෂකවරුන් (FI) හරහා අධිකරණයට නඩු පැවරීමට කටයුතු කරන ලදී.

<u>නීති විරෝධීව මසුන් මැරීම වැළැක්වීම 2025</u>

අනු අංකය	වර්ගය	ප්‍රමාණය
1	මෝර වරල්	357.85 kg
2	මෝර මාලු	2113.2kg
3	වේලන ලද මෝර වරල්	1547.4kg
4	වියළි වරල්	02 Nos
5	ඩොල්පින් මාලු	178 Kg
6	කැස්බෑ මස්	73.55Kg
7	තබූ මාලු	12.5 Kg
8	බින්තර පොකිරිස්සෝ	164 Nos & 7.60Kg

<u>නීති විරෝධී මත් ද්‍රව්‍ය 2025</u>

අනු අංකය	වර්ගය	ප්‍රමාණය
1	අයිස්	114.887KG71mg
2	හෙරොයින්	46.961KG551MG
3	මදන මෝදක	5054 Nos
4	කේරළ ගංජා	934kg 214g
5	දේශීය ගංජා	205.136kg&25g (Seeds)
6	බීඩි කොළ	9380.28kg
7	මත් පෙති	991 Nos
8	හෂීශ්	2.051kg67mg
9	සිගරැට්	4607 Nos
	කසිප්පු	1935 L
11	නීති විරෝධී පළිබෝධනාශක	291 NO 'S

ඇ. **<u>ජීවිත ආරක්ෂක රාජකාරීන්, සෝදිසි සහ බේරා ගැනීමේ මෙහෙයුම්</u>**

වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් 2025 වසර තුළ ජීවිත ආරක්ෂක මුරකුටි 16 ක ජීවිත ආරක්ෂක මෙහෙයුම් කටයුතු සිදුකළ අතර, 2025 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට 2025 දෙසැම්බර් මස 31 වන දින දක්වා මුහුදේ දියනෑමේදී අනතුරට පත් පුද්ගලයින් 180 ක් බේරාගනු ලැබූ අතර, ඉන් 83 ක් විදේශිකයින් විය.

2025 වර්ෂයේ සිදුකරන ලද දියේ ගිලීමෙන් ජීවිත බේරාගැනීමේ විස්තර

වර්ෂය	දේශීය		විදේශීය		එකතුව
	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	
2025	74	23	40	43	180

මාසය	1	2	3	4	5	6	7	8	9	10	11	12	එකතුව
බේරාගත් ජීවිත ගණන	14	36	15	8	1	4	14	15	20	12	22	19	180

තවද, මෙම ආයතනය සතුව ඇති සම්පත් උපයෝගී කරගෙන ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදු කරන සෝදිසි කිරීම් සහ බේරාගැනීම් කටයුතු වලට සහාය ලබා දීම සිදු කරන ලද අතර, ශ්‍රී ලංකා පොලීසිය විසින් සහාය ඉල්ලා සිටි අවස්ථාවලදී ඒ සඳහා අවශ්‍ය සම්පත් සහ ශ්‍රම දායකත්වය ලබාදීම සිදු කරනු ලබයි.

එසේම, ජීවිත ආරක්ෂක මධ්‍යස්ථාන (LIFE SAVING POINT) සහ ධීවර නිරීක්ෂණ මධ්‍යස්ථාන (FISHING MONITORING POINT) සඳහා සංවෘත පරිපථ රූපවාහිනී (CCTV) පද්ධති සවිකිරීම සහ එම පද්ධති ජාල ගත කිරීම මඟින් සෝදිසි කිරීම් සහ බේරා ගැනීම් පිළිබඳ තොරතුරු සුරක්ෂිතව තබාගැනීමට හැකිවීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු පහසු කර ගැනීමට සහ අදාළ අවස්ථාවන්හිදී භාවිත කිරීමට හැකියාව ලැබී ඇත.

ඈ. **සමුද්‍රීය පරිසර ආරක්ෂණය**

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් මෙරට තෙල් කාන්දු වීම් පිළිබඳ පළමු ප්‍රතිචාර දක්වන ආයතනයක් ලෙස කටයුතු කරන අතර ශ්‍රී ලංකා මුහුදු තීරයේ සිදුවන තෙල් කාන්දුවීම් වලට ප්‍රතිචාර දැක්වීමට සුදානමින් සිටී. එබැවින් උතුරු, නැගෙනහිර, දකුණ සහ බටහිර යන වෙරළ ආරක්ෂක කලාප සඳහා තෙල් කාන්දු ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම් සුදානම්ව තබා ඇත. තවද මුහුදට ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීම වැළැක්වීම සඳහා ධීවර යාත්‍රාවල රැගෙන යන ප්ලාස්ටික් ජල බෝතල් ප්‍රමාණය ගණනය කරනු ලබන අතර, හිස් බෝතල් වරාය වෙත රැගෙන එන බව සහතික කරනු ලබයි.

2025 වර්ෂය දී ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි දිවයින වටා ගැඹුරු මුහුදේ හා වෙරළ තීරයන් හා වරායන් සහ ජලාශයන්හි තෙල් විසුරුම් හා කාන්දු වීම් පාලනය හා තෙල් ඉවත් කිරීම් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි.

2025 වර්ෂයේ තෙල් විසිරුම් පාලනය සම්බන්ධ විස්තර

අ/අංක	දිනය	ස්ථානය	ආපදා පිළිබඳ විස්තරය	ඉන්ධන වර්ගය
1	2025.01.19	ගාල්ල වරාය	ගාල්ල වරායේ තුළ ගැටගසා තිබූ SI Nostimo යොට් යාත්‍රාව දියේ ගිලීයාම හේතුවෙන් එක් දිනක් තුළ ඉවත් කරන ලදී.	දැව්තෙල්
2	2025.05.09	මාදුරු ඔය ජලාශය	ගුවන් හමුදාවට අයත් BELL 212 වර්ගයේ හෙලිකොප්ටර් යානයක් යුද හමුදා පුහුණුවක් අතර තුර කඩන් වැටීම.	ගුවන් තෙල් (outer brand)
3	2025.09.21	මිරිස්ස වරාය	JETLINER නැමැති තල්මසුන් බැලීමේ යාත්‍රාවක් ගිලීම හේතුවෙන්.	ඩීසල්
4	2025.10.13	කොළඹ වරාය BQ2	වරාය තුළ තෙල් කාන්දු වීමක් දිස්වී ඇත.	ඩිසල් සහ බිල්ජස්
5	2025.12.14	කොළඹ වරාය SPBM 1 හි	තෙල් නලයක් පිපිරී තෙල් කාන්දු වීමක්	පිරිපහදු නොකරන ලද තෙල්

එමෙන්ම කැස්බෑ බිත්තරසංරක්ෂණය කිරීමේ වැඩසටහන යටතේ කැස්බෑ පැටවුන් ආරක්ෂා සහිතව මුහුදට මුදාහැරීමේ කටයුතු අඛණ්ඩව සිදුකරන අතර, ඒ අනුව මෙම කාලසීමාව තුළ (2025) කැස්බෑ බිත්තර 102309 ප්‍රමාණයක් සංරක්ෂණය කර ඒ අතුරින් පැටවුන් 65680 ක ප්‍රමාණයක් ආරක්ෂිතව මුහුදට මුදාහැර ඇත. තවද, පරිසර හිතකාමී වැඩසටහන් යටතේ වෙරළ ආරක්ෂක කඳවුරු ආශ්‍රිත මුහුදු තීරයන්වල කඩොලාන ශාක වගාකිරීමේ වැඩසටහන් අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධ වී අඛණ්ඩව සිදුකරනු ලබයි.

ඉ. **<u>මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්</u>**

2025 වර්ෂය පුරා මුහුදේදී ජීවිත ආරක්ෂාව, සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සමුද්‍රීය පරිසර ආරක්ෂණය, වෙරළ ආරක්ෂණය, ජීවිත බේරාගැනීම, වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන්, නීති විරෝධීව මසුන් මැරීම වැළැක්වීම, තහනම් මත්ද්‍රව්‍ය සහ මිනිස් ජාවාරම් වැළැක්වීම වෙරළ ආරක්ෂිත කඩොලාන ශාඛ සිටුවීම යන අංශයන් ආවරණය කරමින් වෙරළ බඩ ප්‍රජාව සහ ධීවර ප්‍රජාව දැනුවත් කරන ලදී.

ඊ. **<u>අන්තර්ජාතික සහ කලාපීය සහයෝගිතා වර්ධනය</u>**

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, අන්තර්ජාතික සහ කලාපීය සහයෝගිත්වය වර්ධනයෙහි ලා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ ආයතනය (UNODC), ආසියානු වෙරළාරක්ෂක නියෝජිතායතන රැස්වීමේ ප්‍රධානියා (HACGAM), ජපාන ජාත්‍යන්තරසහයෝගිතා නියෝජිතායනය (JICA), යුරෝපීය සංගමය, ඉන්දියානු සාගර සහයෝගිතා සංගමය (IORA) සමඟ සම්බන්ධීකරණය වී ජාත්‍යන්තර සහ කලාපීය සහයෝගිතාවය වර්ධනය කිරීම සඳහා කටයුතු කරන ලදී.

2.2. <u>ගැටලු, අභියෝග සහ මධ්‍ය කාලීන සැලසුම්</u>

අ. ශ්‍රී ලංකාව ආසන්න වශයෙන් කිලෝමීටර 1,340 ක දිගු වෙරළ තීරයක් සහ වර්ග කිලෝමීටර් 21,500 ක භෞමික මුහුදු ප්‍රදේශයකින් සමන්විත වේ. එහි මුහුදු නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී මුර සංචාරයන් අවශ්‍ය වන අතර එමගින් මෙම මුහුදු ප්‍රදේශයේ සුරක්ෂිතභාවය සහතික කිරීමට හැකිවේ. ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය (IMO) සමඟ ඇති කර ගත් ගිවිසුම් වලට අනුව, ශ්‍රී ලංකාවට වෙන් කර ඇති සෙවුම් සහ මුදාගැනීමේ (SAR) කලාපය විශාල මුහුදු ප්‍රදේශයකින් සමන්විත වන අතර, එය භූමි ප්‍රමාණය මෙන් විසි හත් ගුණයකින් විශාලය. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් දේශ සීමා ආරක්ෂාව, මත්ද්‍රව්‍ය ජාවාරම් වැළැක්වීම, සමුද්‍රීය මුහුදු කොල්ලකෑම් සහ මුහුදේ නීතිවිරෝධී ක්‍රියා වැළැක්වීම, නීතිවිරෝධී, සහ නියාමනය නොකරන ලද මසුන් ඇල්ලීම වැළැක්වීම, නීති විරෝධී සංක්‍රමණ සහ සමුද්‍රීය පරිසර දූෂණය වැළැක්වීම වැනි කටයුතු සීමිත සම්පත් සහ අවම ශ්‍රමදායකත්වය යන අභියෝග හමුවේ වුවද සාර්ථකව ක්‍රියාත්මක කරනු ලබයි.

ආ. **<u>මෙහෙයුම්</u>**

සෝදිසි සහ බේරාගැනීමේ කලාපයක් සහිත ආරක්ෂිත මුහුදු ප්‍රදේශයක් සහ පිරිසිදු සහ නිරසාර සාගර පරිසරයක් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් සලකා බැලීමේදී එම රාජකාරීන් සපුරාලීමට වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ වර්තමාන බලඇණිය සහ යාත්‍රාවන් ප්‍රමාණවත් නොවන බව පෙනීයයි. එබැවින්, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි මෙහෙයුම් හැකියාවන් සහ ධාරිතාව වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. තවද ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක ආයතන, ස්ථාන, උප ස්ථාන, සහ ජීවිතාරක්ෂක මුරකුටි පිහිටුවීම/ වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. එබැවින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා පහත අත්පත් කර ගැනීමේ/ ප්‍රගති සැලැස්ම ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

අ/අ	බලඇණි/ඒකකය	දැනට පවතින	සැලසුම් කළ වර්ෂය				එකතුව
			2026	2027	2028	2029	
01	නිරීක්ෂණ මුර සංචාර නෞකා (OPV)	02			02	-	**0**4
02	වේග මුර නෞකා (FPV)	02		01	-	-	**0**3
03	සාගර දූෂණ පාලන යාත්‍රාව (PCV)	-		01	-		**0**1
04	වේග මුර සංචාර බෝට්ටුව (FPB)	10	01	01	01	01	**1**4
05	වෙරළබඩ මුර සංචාර යාත්‍රා (IPC)	10		04	02	02	**18**
06	තෙල් විසිරුම් පාලන යාත්‍රා	-	03				03
07	සාගර විද්‍යා නිරීක්ෂණ යාත්‍රා				01		01
08	ස්ටැබ්ක්‍රාෆ්ට්	04					**04**
09	වෙ.ආ.දෙපාර්තමේන්තුව ස්ථානගතවී ඇති කඳවුරු	02	**0**6 අත්පත් කර ගැනීම ශ්‍රීලංනාතෙෑ මහවැලි ශ්‍රීලංනාතෙෑ වෙළුසුමණ ශ්‍රීලංනාතෙෑ රන්වැලි නාවික ස්ථානගත කිරීම මඩකලපුව නාවික ස්ථානගත කිරීම ආනවාසල නාවික ස්ථානගතකිරීම් වෙන්තලකෙනි	**0**6 අත්පත් කර ගැනීම ශ්‍රීලංනාතෙෑ කැළණි ශ්‍රීලංනාතෙෑ බුවනේක ශ්‍රීලංනාතෙෑ ගෝකන්න ශ්‍රීලංනාතෙෑ ගෝයයිම්බර් ශ්‍රීලංනාතෙෑ වලගම්බා ශ්‍රීලංනාතෙෑ දීසායු	-		14
10	වෙරළ ආරක්ෂක ස්ථානගතකිරීම්	08	වෙඇස්හලාවත, වෙඇ කිරින්ද වෙඇදෙ කඳවුරක් ලෙස වැඩිදියුණු කිරීම	02 **අත්පත් කර ගැනීම** ශ්‍රීලංනාතෙෑ රුහුණ නාවික අනුකණ්ඩ සංගමන් කන්ද	-	-	10
11	වෙරළ ආරක්ෂක උපපොළවල්	08			-	-	**08**
12	ධීවර නිරීක්ෂණ ස්ථානය	26	**04** සයින්දමර්දු, මුතූර් සල්පයාරු ප්‍රදේශය, මාතගල් වෙරළ	-	-		**3**0
13	ජීවිතාරක්ෂක මුරකුටි	16	16 පොල්මල්කුඩා වෙරළ, කෝකිලායි කලපුව, තුඩාව තුඩුව, කඩයිකාඩු ප්‍රදේශය මාමුනේ ප්‍රදේශය, VTK හික්කඩුව වෙරළ, තල්පේ වෙරළ, පොල්හේන වෙරළ, හිරිකේටිය වෙරළ, කිරින්ද වෙරළ, ගෝපාල්පුරම් වෙරළ, නිලාවෙලි 11 වන සැතපුම් කණුව, නිලාවෙලි වෙරළ, ත්‍රිකුණාමලය නගර බොක්ක, ලන්දේසි බොක්ක වෙරළ, ත්‍රිකුණාමලය ආරුගම්බේ	**02** **ගාලු මුවදොර උස්වැටකෙයියාව**			**3**4

ඇ. NOSCOP (ජාතික තෙල් කාන්දුවීමේ හදිසි සැලැස්ම) අනුව තෙල් කාන්දුවීම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. එසේවුවත් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සාගරයේ පළමු පෙළ තත්ත්වයකට මුහුණ දීමට සම්පූර්ණයෙන්ම සන්නද්ධ නොවන අතර ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, තෙල් කාන්දුවීම් ප්‍රතිචාර දැක්වීමේ හැකියාව පළමු සහ දෙවන මට්ටම දක්වා ඉහළ නැංවීමට අවශ්‍ය තෙල් කාන්දු ප්‍රතිචාර උපකරණ මිලදී ගැනීමට සැලසුම් කර ඇත.

ඈ. **<u>පුහුණු කටයුතු</u>**

වෘත්තීයමය වශයෙන් රාජකාරි ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහ නාවිකයන්ගේ පුහුණුව අනිවාර්ය වේ. පහත දක්වා ඇත්තේ එම පුහුණු වර්ධන වැඩසටහන්ය.

(1) සිවිල් පුද්ගලයින් සඳහා අතරමැදි හා ලෝකඩ පදක්කම් ජීවිතාරක්ෂක පුහුණු පාඨමාලා හඳුන්වාදීම.

(2) ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා ජංගම ජීවිතාරක්ෂක පුහුණු කණ්ඩායමක් පිහිටුවීම.

(3) විදේශ රටවල් සමඟ සහයෝගිතාවයෙන් වැඩි දේශීය පුහුණු අවස්ථා ලබාදීම.

(4) ත්‍රිවිධ හමුදා කාන්තාවන්ට සහ සිවිල් ආරක්ෂක බලකා කාන්තාවන් සඳහා ජීවිතාරක්ෂක පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම

(5) පාසල් ළමුන් සඳහා සහ යොවුන් කණ්ඩායම් සඳහා ජීවිතාරක්ෂක පුහුණු වැඩසටහනක් ආරම්භ කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සහ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත යෝජනා ඉදිරිපත් කර ඇත.

.....

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

<u>පරිච්ඡේදය 3 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය</u>

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශ

එසිඒ-එන්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිසැදන 2025 රු.		සටහන	තක්සා 2025 රු.	2024 රු.	
-	ආදායම් ලැබීම්		735,422.29	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිඒ-1
-	ජාතාන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	735,422.29	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		735,422.29	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අඟිම		323,143,375.00	298,458,127.00	එසිඒ-3
-	තැන්පතු		369,705.40	561,800.00	එසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		-	-	එසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්			813,775.00	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**323,513,080.40**	299,833,702.00	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**324,248,502.69**	299,833,702.00	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		324,248,502.69	299,833,702.00	
	අඩු කළා : වියදම්				
-	ප්‍රතිසංස්කරණ වියදම්		-	-	
300,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	235,268.33	284,172.00	
391,650,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	341,258,700.40	85,582,980.00	එසිඒ-2(ii)
	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	-	-	
-	පොළී ගෙවීම්	8	-	-	
50,000.00	වෙනත් ප්‍රතිසංස්කරණ වියදම්	9	49,300.00	28,150.00	
392,000,000.00	මුළු ප්‍රතිසංස්කරණ වියදම් (ඊ)		**341,543,268.73**	85,895,302.00	
	මූලධන වියදම්				
190,500,000.00	මූලධන වත්කම් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම්	10	190,360,985.53	229,322,036.00	
52,500,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	52,326,748.87	6,394,886.00	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
7,000,000.00	හැකියා වර්ධනය	14	5,871,399.01	3,897,477.00	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
250,000,000.00	මුළු මූලධන වියදම් (උ)		**248,559,133.41**	239,614,399.00	
	තැන්පතු ගෙවීම්		37,200.00	1,142,877.00	එසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		-	-	එසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		37,200.00	1,142,877.00	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		590,139,602.14	326,652,578.00	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(265,891,099.45)	(26,818,876.00)	
	අඟිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(265,891,099.45)	(26,818,876.00)	එසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අඟිම ශේෂය		-	-	එසිඒ-3

1

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

එසේ-8

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	එසේ-6	20,419,302,920.69	2,598,264,825.00
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	එසේ-5/5(ඒ)	-	-
මුදල් හා මුදල් සමාන දෑ	එසේ-3	-	-
මුළු වත්කම්		**20,419,302,920.69**	**2,598,264,825.00**
ඉද්ධ වත්කම් / සංකන්ධය			
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		(882,630.40)	(550,125.00)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		20,419,302,920.69	2,598,264,825.00
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	එසේ-5(බී)		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	එසේ-4	882,630.40	550,125.00
අග්‍රිම ශේෂය	එසේ-3	-	-
මුළු වගකීම්		**20,419,302,920.69**	**2,598,264,825.00**

පිටු අංක.....සිට ..... දක්වා එසේ 1 සිට එසේ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..... සිට ..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 24-02-2026

ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 28/02/2026

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 28/02/2026

එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික)
ඩබ්ලිව්ඕ ආර්ඩබ්ලිපී// ආර්වස්පී/ යුව්ස්පී වීප්වන්ඩූ පීවස්සී
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

R JOSEPH, RSP, USP, NWC, psc
Rear Admiral
Director General - SLCG

AD MADUSHANKA
Accountant
Sri Lanka Coast Guard

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තනත	ප-ශෝධිත
	2025	2024
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල බදු ලැබීම්	-	-
ගෙවූ, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	813,775.00
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම් ලැබීම්	323,143,375.00	298,458,127.00
අත්තිකාරම් අයකර ගැනීම්	-	-
නැන්පතු ලැබීම්	369,705.40	561,800.00
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**323,513,080.40**	**299,833,702.00**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනාඩි හා මෙහෙයුම් වියදම්	341,543,268.73	85,895,301.00
සහනාධාර සහ මාරුකිරීම්	-	-
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	196,232,384.54	-
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්		6,925,078.00
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම්	-	-
අත්තිකාරම් ගෙවීම්	-	-
නැන්පතු ගෙවීම්	37,200.00	1,142,877.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**537,812,853.27**	**93,963,256.00**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**(214,299,772.87)**	**205,870,446.00**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භෞතික වත්කම් විකිණීම්	735,422.29	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**735,422.29**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	52,326,748.87	239,614,399.00
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**52,326,748.87**	**239,614,399.00**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(51,591,326.58)**	**(239,614,399.00)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(265,891,099.45)**	**(33,743,953.00)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	(265,891,099.45)	(33,743,953.00)
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුව % ලෙස
නැත	නැත	නැත	නැත	නැත	නැත

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මූල්‍ය ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	392,000,000.00	392,000,000.00	341,543,268.73	87.13%
ප්‍රාග්ධන	250,000,000.00	250,000,000.00	248,559,133.41	99.42 %

3.7 මු.රෙ 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණු	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2025 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	306,236,746.96	306,236,746.96	-	-
9152	යන්ත්‍රෝපකරණ	188,460,670.40	18,228,333,511.71	-	98.97%
9153	ඉඩම්	1,640,028,000.00	1,644,028,000.00	-	0.24%
9154	අස්පෘශ්‍යවත්කම්			-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්			-	-
9160	කෙරීගෙන යන වැඩ	240,704,662,02	240,704,662,02	-	-
9180	බදු දෙන ලද වත්කම්			-	-

3.9 විගණකාධිපති වරයාගේ වාර්තාව

ඇමුණුම ලෙස ඉදිරිපත් කෙරේ.

<u>පරිච්ඡේදය 4 - කාර්ය සාධන දර්ශක</u>

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

<u>පරිච්ඡේදය 4 - කාර්ය සාධන දර්ශකය</u>

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
වැටුප් හා වෙතන - 1001 අ. වැ/බ ගණකාධිකාරීගේ වැටුප් ගෙවීම. ආ. දෙපාර්තමේන්තු මිලදී ගැනීමේ කමිටු සාමාජිකයින් වෙත ගෙවීම් කිරීම.		78.4%	
දේශීය ගමන් වියදම් - 1101 රාජකාරී ගමන් සඳහා අධිවේගී මාර්ගය භාවිත කිරීම වෙනුවෙන් වියදම් පියවීම.	100%		
විදේශීය ගමන් වියදම් - 1102			65.5%
ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ - 1201 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ලිපි ද්‍රව්‍ය අවශ්‍යතාව මිලදී ගැනීම සම්බන්ධයෙන් වන බිල්පත් ගෙවීම.	99.9%		
ඉන්ධන - 1202 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත වාහන සඳහා නාවික හමුදාව වෙතින් ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම.		84.6%	
ආහාර හා නිළ ඇඳුම් - 1203 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත පුද්ගලයින්ට නිළ ඇඳුම් ලබා දීම.	99.5%		
වෙනත් - 1205 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි කටයුතු කරගෙන යාමට අවශ්‍ය වන පොදු ගබඩා විෂයයන් මිලදී ගැනීම.	94.3%		
වාහන නඩත්තු වියදම් - 1301 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත වාහනවල සුළු අලුත්වැඩියාවන් සහ සේවාවන් කිරීම.	99.7%		
යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ නඩත්තු - 1302 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් විදුලිජනක යන්ත්‍ර, පිටත දහන යන්ත්‍ර හා වායු සමීකරණ යන්ත්‍ර වල අලුත්වැඩියාවන් සහ සේවාවන් සිදු කිරීම.	98.6%		
ගොඩනැගිලි සහ ඉදිකිරීම් - 1303 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි සහ ඉදිකිරීම්වල නඩත්තු කටයුතු සඳහා වන වියදම්.	99.5%		

මෘදුකාංග නඩත්තුව - 1304	91.8%		
ප්‍රවාහන කුලී - 1401 සුදුසු වාහන කුලී පදනම මත ලබා ගැනීම සහ ගලි බවුසර් සහ වතුර බවුසර් කුලී පදනම මත ලබා ගැනීම	100%		
තැපැල් ගාස්තු හා සන්නිවේදන - 1402 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ දුරකථන සහ තැපැල් ගාස්තු සඳහා ගෙවීම්.		82.1%	
විදුලිය හා ජලය - 1403 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි විදුලි හා ජල බිල්පත් සඳහා ගෙවීම්.		86.2%	
බදු කුලී - 1404 ශ්‍රීලංවෙආ වරුණ සහ ඔළුවිල් යන ආයතන පිහිටා ඇති ඉඩම් සඳහා රජයේ බදු ගෙවීම.			55.8%
පිරිසිදු කිරීම් හා පවිත්‍රතා සේවා - 1405	90.3%		
වෙනත් - 1409 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අනෙකුත් පොදු සේවාවන් සිදු කිරීම.		83.48%	
රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම - 1703 දෙපාර්තමේන්තුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.	98.6%		
ගොඩනැගිලි හා ඇකසුම් - 2001 ශ්‍රීලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි පුනරුත්ථාපනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා.	99.6%		
යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ - 2002 ශ්‍රීලංවෙආනෞ සුරක්ෂා නෞකාවේ සහ අනෙකුත් වෙරළ ආරක්ෂක නෞකා සහ යන්ත්‍ර වල පහත සඳහන් අලුත්වැඩියාවන්ට අදාල බිල්පත් ගෙවීම. අ. යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාවන් ආ. වියළි නැව් තටාකාංගනයට ගෙන සිදු කරනු ලබන අලුත්වැඩියාවන්.	100%		
වාහන - 2003 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු වාහනවල ප්‍රධාන අලුත්වැඩියාවන් වන ටින්කරින් කිරීම, පින්තාරු කිරීම සහ අනෙකුත් ප්‍රධාන අලුත්වැඩියාවන් වෙනුවෙන් වන බිල්පත් ගෙවීම .	99.7%		
ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ - 2102 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු රාජකාරීන් සිදු කිරීම සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම.	99.7%		

යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ - 2103 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි නෞකා, යාත්‍රා සහ ආයතනවලට අවශ්‍ය යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම.	99.7%		
පුහුණු කිරීම හා හැකියාවන් වර්ධනය කිරීම - 2401 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ දැනුම සහ හැකියාවන් වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු පාඨමාලාවන් ලබා ගැනීම, දෙපාර්තමේන්තුවේ පුහුණු පහසුකම් වර්ධනය කිරීම.		83.9%	

පරිච්ඡේදය 5 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්ක/ අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
ක්‍රියාත්මක කර නැත	-	-	-	-	-

5.2. තිරසර සංවර්ධන ව්‍යාපෘති දැනට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක නොවන බැවින් ඉලක්ක සපුරා ගැනීම හෝ අභියෝග පිළිබඳ තොරතුරු නොමැත.

<u>පරිච්ඡේදය 6 - මානව සම්පත් පැතිකඩ</u>

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
නිලධාරීන්	125	96	29
නාවිකයින්	1500	1186	314

6.2. වර්තමානයේ ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පුද්ගල අවශ්‍යතාව සම්පූර්ණයෙන්ම සපුරාලනු ලබන්නේ ශ්‍රී ලංකා නාවික හමුදාව විසිනි. මෙහිදී ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු මෙහෙයුම් රාජකාරි ඉටු කිරීම සඳහා ඉහත සඳහන් පරිදි අනුමත සේවක සංඛ්‍යාවක් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් ලබා ගැනීමට අනුමත කර ඇති අතර, ඉහත පරිදි සේවක නිහයක් සහිතව ලබාදී ඇති සේවක සංඛ්‍යාව මඟින් දැනට දුෂ්කරතාවයන් සහිතව වෙරළ ආරක්ෂක රාජකාරි ඉටුකරනු ලබයි.

6.3 **මානව සම්පත් සංවර්ධනය**

1. **<u>ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ පුද්ගලයින් සහභාගී වන පාඨමාලා/ සංචාර - විදේශීය</u>**

අ/අ	පාඨමාලාවේ නම, සම්මන්ත්‍රණය සහ අභ්‍යාසය	පාඨමාලා ගණන සම්මන්ත්‍රය සහ අභ්‍යාසය	සහභාගී වන්නන් සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව (දින)	සමස්ථ ආයෝජන (රු)		වැඩසටහනේ ස්වභාවය දේශීය/ විදේශීය	ප්‍රතිදානය/ ලබාගත් දැනුම
					දේශීය	විදේශීය		
1	නීති උපාධි සහතික පාඨමාලාව (සමුද්‍රීය අධ්‍යයන)	01	03	143	-	344,134.10	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
2	MRCC මෙහෙයුම් සහ SAR පාඨමාලාව	01	04	07	-	101,000.00	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
3	සමුද්‍රීය නීතිය සහ මෙහෙයුම් පාඨමාලාව (II අදියර)	02	06	07	-	680,211.5	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
4	ජාත්‍යන්තර සමුද්‍රීය මෙහෙයුම් මට්ටම I සහ II පාඨමාලාව (අදියර II)	02	04	07	-	124,105.49	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
5	තෙල් ඉහිරුම් ප්‍රතිචාර වැඩමුළුව (OSRW)	01	02	08	-	75,999.30	විදේශීය	තෙල් විසිරීම් කළමණාකරනය කිරීමේ පුහුණුව
6	OCCP මඟින් හදිසි ප්‍රතිචාර පුහුණුව ලබා දීම	01	09	12	-	927,189.96	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
7	දකුණු ආසියානු මුහුදු කලාපීය රටවල තෙල් කාන්දු ප්‍රතිචාර දක්වන්නන් සඳහා SACEP - OCPP එක්සත් රාජධානියේ උපායමාර්ගික විශේෂඥ පුහුණුව	01	02	05	-	75,250.00	විදේශීය	තෙල් විසිරීම් කළමණාකරනය කිරීමේ පුහුණුව සහ වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
8	සමුද්‍ර දූෂණ ආකෘති නිර්මාණය පිළිබඳ OCPP වැඩමුළුව	01	02	03	-	180,431.52	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
9	වෙරළාරක්ෂක මූලික කිමිදුම් පාඨමාලාව	01	01	30	-	Payment Navy	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
10	සමුද්‍රීය ආරක්ෂක මෙහෙයුම් (LAMSO) පාඨමාලාවේ නීතිමය අංශ,	01	01	30	-	114,031.25	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
11	අග්නිදිග ආසියානු සහයෝගිතාව සහ පුහුණුව (SEACAT) 2025	02	08	05	-	289,912.50	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
12	කුන්මීන් සංචලනය මඟින් සමුද්‍ර සංරක්ෂණය ඒකාබද්ධ කිරීම MTCP - කෝස්ටා සඳහා මොන්ට්‍රියල් කැපවීම්	01	01	08	-	69,237.50	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
13	UNODC පුහුණු වැඩසටහන	01	01	04	-	38,092.00	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම

14	තෙල් මිශ්‍ර ප්‍රතිචාර විෂය කරුණු විශේෂඥ හුවමාරුව පුහුණු වැඩසටහන	01	02	05	-	152,000.00	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
15	JICA යටතේ ජාත්‍යන්තර සහයෝගිතාව සඳහා වූ සමුද්‍රීය ආරක්ෂාව සහ ආරක්ෂක සංවාදයේ 10 වන සංවත්සර සම්මන්ත්‍රණය (මාස්ටර් වැඩසටහන)	01	03	04	-	107,006.25	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
16	4 වන වෙරළාරක්ෂක ගෝලීය සමුළු පූර්ණ සමුළුව අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගී වීම	01	01	02	-	37,148.00	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
17	cox bazar හි ජාත්‍යන්තර මිනිස් ජාවාරම් විමර්ශන වැඩසටහන	01	01	12	-	107,425.00	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
18	වෙරළාරක්ෂක භටයින් සඳහා සමුද්‍රීය වසම් දැනුවත් කිරීමේ (MDA) වැඩමුළුව	01	04	05	-	215,850.00	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
19	JICA සමුද්‍රීය ආරක්ෂාව සහ ප්‍රතිපත්ති පිළිබඳ මාස්ටර් වැඩසටහන	01	01	346	-	115,994.53	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
20	සමුද්‍රීය සෙවීම් සහ මුදාගැනීම් සමුද්‍රීය ව්‍යසනය	01	01	42	-	115,012.50	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
21	10 වන ජාතික දූෂණ ප්‍රතිචාර අභ්‍යාසය (Natpolrex - 25)	01	01	05	-	38,247.00	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
22	මැලේසියානු නාක්ෂණික සහයෝගිතා වැඩසටහන (MTCP)	01	01	12	-	100,600.00	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
23	2025 RSO ආදි ශිෂ්‍ය කඳවුර සහ සිව්වන RSO සංසදය	01	01	04	-	38,468.75	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
24	13 වන Barracuda අභ්‍යාස මාලාව	01	01	03	-	39,421.56	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
25	8 වන ICG SLCG ඉහළ මට්ටමේ රැස්වීම	01	03	03	-	147,648.50	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිලිබඳ පුහුණුවීම් සිදු කිරීම සහ වැඩිදියුනු කිරීමට කටයුතු කිරීම
26	නිරසාර මසුන් ඇල්ලීම සහ නීති විරෝධී මසුන් ඇල්ලීමට එරෙහිව සටන් කිරීම වැඩසටහන අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගී වීම	01	01	26	-	86,184.00	විදේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම

2. <u>ශ්‍රී ලංකා වෙරළාරක්ෂක පුද්ගලයින් සහභාගී වූ පාඨමාලා - දේශීය</u>

අ/අ	පාඨමාලාව	පාඨමාලා ගණන	සහභාගී වූ ගණන	වැඩසටහනේ කාල සීමාව (දින)	සමස්ථ ආයෝජන (රු)		වැඩසටහනේ ස්වභාවය දේශීය/ විදේශීය	ප්‍රතිඵලය/ ලබාගත් දැනුම
					දේශීය	විදේශීය		
1	වෙරළාරක්ෂක මූලික පුහුණු පාඨමාලාව	4	99	08	-	-	දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
2	තෙල් ඉහිරුම් කළමනාකරණ පුහුණු පාඨමාලාව	03	43	12	-	-	දේශීය	තෙල් ඉහිරීම් වැළැක්වීමේ සහ කළමනාකරණය කිරීමේ හැකියාව රාජකාරි පිළිබඳ දැනුම
3	RHIB ක්‍රියාකරු පාඨමාලාව	1	21	07	-	-	දේශීය	RHIB කුඩා යාත්‍රා හැසිරවීම පිළිබඳ දැනුම
4	ATV පුහුණු පාඨමාලාව	1	15	06	-	-	දේශීය	ATV හැසිරවීම පිළිබඳ දැනුම

5	වෙරළාරක්ෂක මූලික පුහුණු පාඨමාලාව	2	50	08	-	-	දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
6	බහු කුසලතා පුහුණු වැඩසටහන	1	08	12	-	-	දේශීය	වෙරළාරක්ෂක බහු කාර්ය පිලිබඳ දැනුම
7	නියමුවන් රහිත යානා හැසිරවීමේ පාඨමාලාව	2	37	05	-	-	දේශීය	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරිවල සෙවීම් සහ මුදාගැනීමේ මෙහෙයුම්
8	ආත්මාරක්ෂක සටන් පුහුණු පාඨමාලාව	01	20	12	-	-	දේශීය	වෙරළාරක්ෂක රාජකාරි කිරීමේදී ආත්මාරක්ෂාව පිළිබඳ දැනුම
9	ආත්මාරක්ෂක සටන් පුහුණු උපදේශක පාඨමාලාව	01	17	05	-	-	දේශීය	වෙරළාරක්ෂක රාජකාරි කිරීමේදී ආත්මාරක්ෂාව පිළිබඳ දැනුම
10	අනතුරු අණදෙන පද්ධතිය (ICS) පාඨමාලාව	1	08	03	-	-	දේශීය	අනතුරු අවස්තාවක නිවැරදි ක්‍රියා කිරීමේ හැකියාව

3. ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා ලබාදුන් ජීවිතාරක්ෂක පාඨමාලා

අ/අ	පාඨමාලාවේ නම	පාඨමාලා ගණන	සහභාගී වූ ගණන	වැඩසටහනේ කාල සීමාව (දින)	සමස්ථ ආයෝජන (රු)		වැඩසටහනේ ස්වභාවය දේශීය/ විදේශීය	ප්‍රතිදානය/ ලබාගත් දැනුම
					දේශීය	විදේශීය		
1	ජීවිතාරක්ෂක මූලික මට්ටම, ප්‍රථමාධාර සහ CPR පාඨමාලාව සඳහා SLCG	5	29	12	-	-	ජීපුපා බලපිටිය	ජීවිතාරක්ෂක රාජකාරිය ඉටු කිරීමේ හැකියාව
2	ජීවිතාරක්ෂක අතරමැදි මට්ටමේ පාඨමාලාව SLCG	3	19	12	-	-		
3	ජීවිතාරක්ෂක ලෝකඩ පදක්කම් පාඨමාලාව SLCG	1	9	12	-	-		
4	ජීවිතාරක්ෂක රිදී පදක්කම් පාඨමාලාව SLCG	1	3	16	-	-	ජීපුපා බලපිටිය	
5	තටාක ජීවිතාරක්ෂක පාඨමාලාව SLCG	2	21	05	-	-		
6	ජීවිතාරක්ෂක උපදේශක පාඨමාලාව SLCG	1	3	05	-	-		

4. ත්‍රිවිධ හමුදාව සහ අනෙකුත් සංවිධාන/ ආයතන, විදේශකයින් සඳහා ලබා දුන් ජීවිතාරක්ෂක පාඨමාලා

අ/අ	පාඨමාලාවේ නම	පාඨමාලා ගණන	සහභාගී වූ ගණන	වැඩසටහනේ කාල සීමාව (දින)	සමස්ථ ආයෝජන (රු)		වැඩසටහනේ ස්වභාවය දේශීය/ විදේශීය	ප්‍රතිදානය/ ලබාගත් දැනුම
					දේශීය	විදේශීය		
1	ජීවිතාරක්ෂක මූලික මට්ටම, ප්‍රථමාධාර සහ CPR පාඨමාලාව සඳහා SLA, SLN, SLAF, wildlife,ICG	7	97	12	-	-	ජීපුපා බලපිටිය	ජීවිතාරක්ෂක රාජකාරිය ඉටු කිරීමේ හැකියාව
2	ජීවිතාරක්ෂක අතරමැදි මට්ටමේ පාඨමාලාව SLA, SLN, SLAF	2	41	12	-	-		
3	ජීවිතාරක්ෂක රිදී පදක්කම් පාඨමාලාව SLA, SLN, SLAF	2	25	16	-	-		
4	ජීවිතාරක්ෂක ලෝකඩ පදක්කම් පාඨමාලාව SLA, SLN, SLAF	1	7	12	-	-		
5	ජීවිතාරක්ෂක සහ ප්‍රථමාධාර පුහුණු වැඩසටහන	1	48	01	-	-	මාතර	හෘද පුප්ඵුසීය තෙරපුම් ලබා දීමේ පුහුණු වැඩසටහන
6	සිවරයින් සඳහා ප්‍රථමාධාර පුහුණුව	4	245	01	-	-	සූරියවැව, වලස්මුල්ල, හම්බන්තොට, තංගල්ල	හෘද පුප්ඵුසීය තෙරපුම් ලබා දීමේ පුහුණු වැඩසටහන

<u>පරිච්ඡේදය 7 - අනුකූලතා වාර්තාව</u>

අනු. අං.	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා පැහැදිලි කිරීම	අනුකූළ නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ	වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත නාවික හමුදාව වෙතින් ද්විතීක පදනම මත කාර්යමණ්ඩලය අනුයුක්ත කර ඇති බැවින් එවැනි ගිණුමක් පවත්වාගෙන යනු නොලැබේ.	
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ	වෙඅාදෙ විසින් ව්යාපාර හා නිෂ්පාදන කටයුතු සිදු කරනු නොලබයි.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ	වෙඅාදෙ තුළ එවැනි ගිණුමක් පවත්වාගෙන යනු නොලබයි.	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ	වෙඅාදෙ තුළ එවැනි ගිණුමක් පවත්වාගෙන යනු නොලබයි.	
1.6	වෙනත්	නැත		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ 445 අනුව)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ /267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාළ නොවේ	වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත නාවික හමුදාව වෙතින් ද්විතීක පදනම මත කාර්යමණ්ඩලය අනුයුක්ත කර ඇති බැවින් ඔවුන්ගේ පඩි නඩි නාවික හමුදාව වෙතින්ම ගෙවනු ලබයි.	
2.3	විගණන විමසුම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූලවේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ CIGAS පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.7	ඉන්වෙන්ටරි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැර කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප ප්‍රකා පොත් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී නිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර නිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී නිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේදී ගණකාධිකාරිවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අදාළ නොවේ	ද්විතික පදනම මත නාවික හමුදාව වෙනින් කාර්යමණ්ඩලය අනුයුක්ත කර ඇති බැවින් වැටුප් සැකසීමක් සිදුනොවේ.	
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණනකාධිපති වරය විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී නිබීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මූ.රෙ 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණනකාධිපති වරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා නිබීම.	අනුකූල වේ.		

6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උපවගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දේපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA වක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.	2024 වර්ෂයේ ප්‍රථම, දෙවන, තුන්වන සහ සිව්වන කාර්තුවන්ට අදාළව කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වන ලදි.	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	2017/01 අංක දරන වත්කම් කළමනාකරන වක්‍ර ලේඛනයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීමේ හා අපහරණය කිරීම පිළිබඳව තොරතුරු කොමිප්ටරෝ ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් වක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම වක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොමිප්ටරෝ ලර් ජනරාල් කාර්යාලයට වර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් වක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ වක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103, 104, 109 සහ 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 වන දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන වක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		

9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කිරීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා සැලසුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රති පාදන උපයෝජනය**	**අනුකූල වේ**		
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ 94 (1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට ඵලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අක්තිකාරම් ගිණුම**	අදාළ නොවේ	ද්විතික පදනම් මත නාවික හමුදාව වෙතින් කාර්යමණ්ඩලය අනුයුක්ත කර ඇති බැවින් වෙආදෙ වෙතින් ණය ලබා දීමක් සිදුනොකරයි.	
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූලවේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අදාළ නොවේ	වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව හිඟ හිටි ණය ශේෂයන් පවත්වාගෙන යනු නොලැබේ.	
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීම	අදාළ නොවේ		
13	**පොදු තැන්පත් ගිණුම**	**අනුකූල වේ**		
13.1	කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**	**අනුකූල වේ**		
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල්පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිමඵම කාර්ය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		

14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම්**	.		
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට නිබීම	අදාළ නොවේ	මෙම දෙපාර්තමේන්තුව ආදායම් උපයන ආයතනයක් නොවන බැවින් අදායම් ගිණුම් පවත්වාගෙන යාමක් සිදු නොකෙරේ	
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර නිබීම.	අදාළ නොවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී නිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD වක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී නිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳව මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා නිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර නිබීම	අනුකූල නොවේ	2024 වර්ෂයට අදාළව තොරතුරු ඉල්ලීම් නොමැත	
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය වක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර නිබීම	අනුකූල වේ	මෙතෙක් සම්පාදනය කර නොමැත	ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය
18.2	එම වක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි සේවාලාභී ප්‍රඥප්තිය/ පුරවැසි සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස්කොට නිබීම	අනුකූල වේ	මෙතෙක් සම්පාදනය කර නොමැත	ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට නිබීම	අනුකූල නොවේ	මෙතෙක් සම්පාදනය කර නොමැත	ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය

19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	වාර්ෂික කාර්ය සාධක ගිවිසුම අත්සන් කොට නොමැත	අත්සන් කිරීමට නියමිතය
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළි යෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළි බඳව වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදිකොට තිබීම.	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩී.ටී.එන්/බී/සිසිජ්/2025/02/06

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2026 මැයි 27 දින



අධ්‍යක්ෂ ජනරාල්

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

කේ.කේ.පී.ජයකොඩි

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

By DG - SLCC

Action:- DLA(G), SO(LA), SLE
Need to address all observations

Information:-

Sig:

Date: 31/05/2025

පිටපත් :- 1. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
2. ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

CamScanner

මගේ අංකය
எனது இல.
My No. DEF/B/DCG/2025/02/06

මගේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2026 මැයි 27 දින

LIVE! 31 MAY 2026

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ නොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
+94 11 2 88 70 28 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
+94 11 2 88 72 23
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

CamScanner

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

CamScanner

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂාවන් සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක: 02/2025 හි 4:1 ඡේදය ප්‍රකාරව ප්‍රධාන ගණකාධිකාරි විසින් අදාළ මූල්‍ය ප්‍රකාශන වල ඇති විස්තර අවසාන භාණ්ඩාගාර මූල්‍ය ප්‍රකාශන සමඟ එකඟ වන බවට ද එහි 3.2 ප්‍රකාරව වාර්තාකරණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සංඛ්‍යා, අවසාන භාණ්ඩාගාර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ආදායම්, වියදම් සහ ප්‍රධාන ලෙජර් ශේෂයන් සමඟ එකඟ වන බවට ද සහතික විය යුතුය. කරුණු එසේ වුවද ඒසිඒ - (එම්): මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ බදු නොවන ආදායම් හා වෙනත් ලෙස දක්වා ඇති රු. 735,422 ක වටිනාකම භාණ්ඩාගාර මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව නොමැති අතර ආදායම් හා සම්බන්ධ CIGAS වෙබ් යෙදුම් පද්ධතියෙන් ලබාගත් අවසාන භාණ්ඩාගාර මූල්‍ය ප්‍රකාශන වන SA-20 සහ SA-21 තුල ඇතුළත්ව නොතිබුණි.

1.6.2 පුනරාවර්තන වියදම්

(අ) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක: 02/2025 හි 06 ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ආයතනය අදාල මුදල් ප්‍රවාහයන් සහ හරස් සටහන් ඇතුලත් කරමින් පිළියෙල කල යුතු වුවද මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය තුල ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ඉන්ධන වියදම් වැය විෂයය වෙනුවෙන් දරන ලද රු 228,667,600 ක් ද යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් දරන ලද මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, වැය විෂයයය වෙනුවෙන් දරන ලද වියදම් රු.37,223,499 ක් ද ඇතුලත් බැවින් එකතුව රු.265,891,099 කින් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ඌණ නක්සේරු වී තිබුණි.

(ආ) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 හි 3.3 ඡේදය ප්‍රකාරව, වාර්තාකරණ ආයතනයේ ඇති බැඳීම් සහ බැරකම් 2025 දෙසැම්බර් 31 දිනට බැඳීම් අංක අනුව හෙළිදරව් කළ යුතු අතර, එහි 06 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිත කළ යුතු ආදර්ශ ආකෘතීන් යටතේ දක්වා ඇති පරිදි බැරකම් පිළිබඳ ප්‍රකාශනයන් පිළියෙල කළ යුතුය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල බැරකම් නොමැති ලෙස සලකා පිළියෙල කර තිබුණද 2026 වර්ෂයේ ජනවාරි වියදම් පරීක්ෂාවට අනුව සමාලෝචිත වර්ෂයට අදාලව රු.1,729,136 ක් වටිනා බැරකම් නිරවුල් කර තිබුණි.

(ඇ) 2025 වර්ෂයේ වැටුප් හා වේතන යටතේ ප්‍රතිපාදන ලෙස රු.300,000 ක් වෙන් කරවා ගෙන ඇති අතර මෙය ගණකාධිකාරීගේ වැටුප් ගෙවීම් සඳහා විය. මෙම දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් සහ නාවිකයින් සේවය සඳහා අනුයුක්ත කරන අතර එම කාර්ය මණ්ඩලයේ වැටුප් ගෙවීම් ශ්‍රී ලංකා නාවික හමුදාව මගින් සිදු කෙරේ. ඒ අනුව සමාලෝචිත වර්ෂයේද ශ්‍රී ලංකා නාවික හමුදාව මගින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත නාවික හමුදා නිලධාරීන් සහ

CamScanner

නාවිකයින් වෙනුවෙන් රු. 1,527,219,01 ක් වැටුප් ලෙස ගෙවා නිබුණි. ඒසිඒ-2(ii) ආකෘතිය තුල මෙම ගෙවීම් පිළිබඳ විශේෂ සටහනක් ලෙස සඳහන් කර ඇතත් එම වටිනාකම වෙරළ ආරක්ෂක දෙපාර්තමේනතුවට අදාල වියදමක් ලෙස ගිණුම් ගතව නොනිබුණි. එබැවින් එම වටිනාකමින් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වියදම් ඌන තක්සේරු වී නිබුණි.

1.6.3 මූලධන වියදම්

2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 හි 7.8 ඡේදය ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් වැයකිරීම් යටතේ වන " මූලධන වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කරගැනීම" යටතේ ඇතුළත් කළ යුත්තේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් වත්කම් අත්පත්කර ගැනීමට දරන ලද වියදම් පමණි. එසේම,එහි 7.9 ඡේදය ප්‍රකාරව, වියදම් හැර මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්වලට අදාල වියදම් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් වැයකිරීම් යටතේ දැක්විය යුතුය. ඊට අමතරව 7.10 ඡේදය ප්‍රකාරව 2024 වර්ෂයේ සඳහා වූ සන්සන්දනාත්මක සංඛ්‍යාද 7.8 හා 7.9 ඡේදය ප්‍රකාරව දැක්විය යුතුය. රු.233,219,513 ක් වූ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්වලට අදාල වියදම් ඉහත මාර්ගෝපදේශ ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් වැයකිරීම් යටතේ නොදක්වා ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් වැයකිරීම් යටතේ දැක්වීම තුළ සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ අන්තර්ගත 2024 වර්ෂය සඳහා වූ සන්සන්දනාත්මක සංඛ්‍යාවල මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.233,219,513 කින් වැඩියෙන් දක්වා නිබූ අතර ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් අඩුවෙන් දක්වා නිබුණි.

1.6.4 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක: 02/2025 හි 06 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කල යුතු ඒසිඒ-7 - අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය ආදර්ශ ආකෘතියෙහි වෙනත් ආයතන විසින් වාර්තාකරණ ආයතනය වෙනුවෙන් දරන ලද වියදම් අඩු කර පෙන්විය යුතුය. SA-11-1 භාණ්ඩාගාර මූල්‍ය ප්‍රකාශනය තුල වෙනත් ආයතන විසින් වාර්තාකරණ ආයතනය වෙනුවෙන් දරන ලද සමස්ථ වියදම රු.265,891,099 ක් ලෙස දක්වා ඇති නමුත් එය මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත ඒසිඒ-7 ආකෘතිය තුල අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් දරන ලද වියදම් ලෙස එකතු කර දක්වා නිබුණි.

1.6.5 මූල්‍ය නොවන වත්කම්

(අ) 2025 මැයි 17 වන දිනැති අංක DGCG/AUD/10 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් DEF/B/DCG/2025/02/06 දරන කෙටුම්පත් වාර්තාව සඳහා ඉදිරිපත් කරන ලද පිළිතුරු ලිපියට අනුව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු වටිනාකම් සඳහන් කර ඇති මෝටර් රථ වල මුළු වටිනාකම රු. 108,123,204.57ක් වූ නමුත් භාණ්ඩාගාර මුද්‍රිත SA 82 ප්‍රකාරව නෞකා හා යාත්‍රා හැර වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු මුළු ප්‍රවාහන උපකරණවල එදිනට මුළු වටිනාකම රු.117,320,540 ක් විය. ඒ අනුව භාණ්ඩාගාර මුද්‍රිත SA 82 ප්‍රකාරව 2025 දෙසැම්බර් 31 දිනට නෞකා හා යාත්‍රා හැර ප්‍රවාහන උපකරණ වල මුළු වටිනාකම හා 2025 මැයි 17 වන දින නිකුත් කරන ලද පිලිතුරු ලිපිය තුළ අන්තර්ගත නෞකා හා යාත්‍රා හැර ප්‍රවාහන උපකරණ තුළ වටිනාකම අතර රු.9,197,336 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය නොවන වත්කම් වාර්තාව (SA 82) අනුව සමාලෝචිත වර්ෂයේදී රු.52,885,478 ක් වටිනා මූල්‍ය නොවන වත්කම් මිලදී ගෙන ඇත. නමුත් ඒසිඒ - 2 (i) අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම යටතේ ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ සඳහා රු. 996,624 ක් සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සඳහා රු.51,330,124 ක් ලෙස එකතුව රු.52,326,748 ක් වැය කර නිබුණි. ඒ අනුව ඒ.සී.ඒ 2 (i) ප්‍රකාරව මූලධන වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරන ලද පිරිවැය හා SA 82 ප්‍රකාරව වටිනාකම් අතර රු. 558,730 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2026 මැයි 17 දිනැති DGCG/AUD/10 අංක දරන ලිපිය මගින් ඉදිරිපත් කර ඇති නොරතුරු අනුව අංක WP KG 5476 දරන ජීප් රථය සහ අංක WP PF 5410 දරන කැබ් රථය ප්‍රදානයන් ලෙස හිමිව ඇති අතර එම මෝටර් රථ 2025 දෙසැම්බර් මස 31 දිනට දෙපාර්තමේන්තුව සතු මෝටර් රථ විය. එහි වටිනාකම් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් තුල ඇතුලත් කර නොතිබූ බැවින් බැවින් 2025 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය නොවන වත්කම් ඒකාබද්ධ තක්සේරු වී නිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී නිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර නිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීම ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වුවද, 1202 ඉන්ධන වැය විෂයෙහි ඇස්තමේන්තු ප්‍රතිපාදනය වූ රු.304,000,000 කින් රු.29,000,000 ක් එනම් සියයට 9.5 ක් වෙනත් වැය විෂයයන් 05 ක් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් මාරු කර නිබුණි.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය	සියලුම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් තම ආයතනය වෙනුවෙන් සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු අතර ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු නමුත් ඊට පටහැනිව 2025 වර්ෂයේ පළමු මාස 04 සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට 2025 පෙබරවාරි මස 03 වන දිනද 2025 වර්ෂයේ ඉතිරි කාලවිච්ඡේදය සඳහා සකස්කල ක්‍රියාකාරී සැලැස්මට 2025 ජුනි 16 වන දිනද අනුමැතිය ලැබී නිබුණි.
(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය	සියලුම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ප්‍රසම්පාදන කටයුතු සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු අතර සියලුම ගණන්දීමේ නිලධාරීන් විසින් තම ආයතනයට පැවරී ඇති විෂයයන් හා කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

CamScanner

ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගෙන එහි පිටපතක් ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වුවද ප්‍රසම්පාදන සැලැස්ම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය නියමිත දිනය පසුවී මාස 06 කට පසුව ලැබී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 98 ක් යටතේ වෙරළ ආරක්ෂක වරුණ ආයතනය සඳහා නේවාසික හා පරිපාලන පහසුකම් සහිත නව සිවි මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර තිබූ අතර 2022 හා 2023 වර්ෂවල මේ සඳහා පිළිවෙලින් රු.මිලියන 10 ක් හා රු.මිලියන 35 ක් බැගින් එකතුව රු.මිලියන 45 ක් වෙන් කර තිබූ අතර එම වර්ෂවල පිළිවෙලින් රු. මිලියන 4.91 ක් හා රු.මිලියන 13.71 ක් වශයෙන් එකතුව රු. මිලියන 18.62 ක් වූ වියදමක් දරා ඉදිකිරීම් සඳහා ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. ඉඩමේ අයිතිය පිළිබඳ ගැටළුවක් හේතුවෙන් 2025 දෙසැම්බර් 31 දිනට එහි භෞතික ප්‍රගතිය ශූන්‍ය අගයක් ගෙන තිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම තුළ ප්‍රසම්පාදනයන් 1,239 ක් සැලසුම් කර තිබුණි. එයින් ලිපිගොණු කටයුතු නවතා දමා තිබූ ප්‍රසම්පාදන 336 ක් ද, සැපයුම්කරුවන් විසින් ප්‍රසම්පාදන ඉටු කිරීම පැහැර හැර තිබූ 13 ක් ද, සැපයුම්කරුවන්ට ඇති නොහැකියාව මත කාර්යයන් සිදුකර නොනිබූ 43 ක් ද, 2026 වර්ෂය සඳහා රැගෙන යාමට කටයුතු කර තිබූ 102 ක් ද වශයෙන් ඉටු කර නොනිබූ මුළු ප්‍රසම්පාදනයන් ප්‍රමාණය 494 ක් හෙවත් සියයට 40 ක් විය. නවද ප්‍රසම්පාදනයන් 03 කට අදාලව වටිනාකම් පිළිවෙලින් රු.7,525,096 ක්, රු. 7,525,096 ක් හා රු.7,575,000 ක් වූ ප්‍රසම්පාදනයන් සඳහා ලංසු සුරක්ෂණ ලබා ගෙන නොනිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

(අ) භාණ්ඩාගාර මුදිත SA 82 ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අයත් නෞකා/බෝට්ටු යාත්‍රා වටිනාකම් රු.17,573,215,159 ක් වන අතර ඒ අතරින් රු.1,519,964,606 ක වටිනාකමකින් යුත් නෞකා/බෝට්ටු සහ යාත්‍රා 10 ක් 2025 දෙසැම්බර් 31 දිනට ක්‍රියාවිරහිතව පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගනු ලබන නාගරික සංවර්ධන අධිකාරිය සතු වැල්ලවත්තේ පිහිටි වරුණ ආයතනය පවත්වාගෙන යනු ලබන ඉඩම් කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා යොදවාගැනීමට නියමිත බැවින් 2025 ජූලි 01 දිනැති අංක MCD/CSD/CG/01 – 20 දරණ අරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය මඟින් සුදුසු වෙනත් ඉඩමක් සොයා නොරතුරු ඉදිරිපත් කරන ලෙස දැනුවත් කර තිබුණි. ඒ සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් ශ්‍රී ලංකා නාවික නෞකා කැළණි ආයතනය පිහිටි ඉඩම වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීම සඳහා 2025 ජූලි 29 දින නාවික හමුදාපතිගෙන් ඉල්ලීමක් කර ඇති නමුත් ඒ සඳහා ප්‍රතිචාර නොලැබීම මත සුදුසු වෙනත් ඉඩමක් ලැබී නොනිබුණි.

(ඇ) බලපිටිය, පානදුර හා කොඩ්බේ පිහිටි වෙනත් දෙපාර්තමේන්තු හා ආයතන සතු නමුත් දෙපාර්තමේන්තුව විසින් පිළිවෙලින් 2012, 2009 හා 2020 සිට භාවිතයට ගන්නා ඉඩම් වන නමුත් පවරා ගැනීමට අපොහොසත්ව තිබුණි.

(ඇ) අංක CG 403 හා අංක CG 405 නෞකා දෙක ක්‍රියාවිරහිත වීම හේතුවෙන් අළුත්වැඩියා කටයුතු සඳහා යොමුකර තිබුණද අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන බැවින් මෙම යාත්‍රා දෙක සුදුස්සක් කිරීමට යෝජනාකර තිබුණද ඒ සඳහා ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි.

4.4 කළමනාකරණ දුර්වලතා

2009 අංක 41 දරන ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පනත පරිවර්තන කර නව පනතක් සම්පාදන කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 2016 නොවැම්බර් 08 දිනැති අංක 16/2249/703/093 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී තිබුණද එම පනත පරිවර්තන කර නව පනතක් සම්පාදනය කිරීමේ කටයුතු අවසන්ව නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

2021 වර්ෂයේ සිට 2025 දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවයේ නියුක්ත 647 දෙනෙකු ජීවිතාරක්ෂක පුහුණුව ලබාදීමට කටයුතු කර තිබුණි. දෙපාර්තමේන්තුව සඳහා නිලධාරීන් හා නාවිකයින් පත් කිරීමේදී වසර 02 ක කාලයක් සඳහා නාවික හමුදාවේ සේවයේ නියුක්ත නිලධාරීන් හා නාවිකයින් පත් කරගැනීමක් සිදු වුවද ජීවිතාරක්ෂක පුහුණුව ලැබුවන් අනුයුක්ත නොකිරීම මත 2025 දෙසැම්බර් 31 දින වන විට බටහිර ප්‍රාදේශීය මුහුදු කලාපය, දකුණු ප්‍රාදේශීය මුහුදු කලාපය හා නැගෙනහිර ප්‍රදේශීය මුහුදු කලාපය සඳහා පිළිවෙලින් 16, 16 හා 06 වශයෙන් ජීවිතාරක්ෂක පාඨමාලාව හැදෑරූ නාවිකයන් 38 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

කේ.කේ.එස්.පියකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

CamScanner